**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අංක 1877/28 දරන 2014.08.28 දිනැති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ 11.2 වගන්තිය යටතේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ප්‍රධාන වාස්තු විද්‍යාඥ තනතුරේ පුරප්පාඩුව පිරවීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ඇති කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ප්‍රධාන වාස්තු විද්‍යාඥ තනතුරට පත් කිරීම සඳහා අංක 1877/28 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කරන ලද, 1994/68 හා 2016 නොවැම්බර් මස 24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධනය කරන ලද 2006.01.01 දින සිට බලාත්මක හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.2 වගන්තියට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2085/46 හා 2018.08.24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධනය කරන ලද්දා වූ විධිවිධාන ප්‍රකාරව, නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ දැනට I ශ්‍රේණියට උසස් වීම් ලැබූ සක්‍රිය සේවයේ නියුතු නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **පුරප්පාඩු සංඛ්‍යාව :**

| *අනු. අංකය* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු ගණන* |
|---|---|---|---|
| 01 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | ප්‍රධාන වාස්තු විද්‍යාඥ (ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණිය) | තනතුරු 01 |

**02. සපුරාලිය යුතු සුදුසුකම් :**

I. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**03. තනතුරු සඳහා තෝරා ගනු ලබන ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, එම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පහත දක්වා ඇති ලකුණු ලබා දීමේ පරිපාටිය අනුව ලකුණු ලබා දෙනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක් කර, ඔවුන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය සඳහා ලබා ගන්නා ඒකාබද්ධ ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙල මත ඉහත දක්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී වන ලෙස අදාළ තනතුරට පත් කරනු ලබන අතර පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි.

**04.** ලකුණු පරිපාටිය :

| *ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා යෝග්‍යතාවය හා කුසලතාවය මත තනතුරට පත් කිරීම - අනුමත ලකුණු පරිපාටිය* | *උපරිම ලකුණු* | *මුළු ලකුණු* |
|---|---|---|
| **01.** සේවා පළපුරුද්ද<br><br>ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දේ.<br><br>**01.1** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 01/2019 අනුව ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ඉහළම සේවා කාලයක් සහිත නිලධරයාට උපරිම ලකුණු ප්‍රමාණය ද අනෙකුත් නිලධරයන්ට ඊට සමානුපාතික ලෙස ද ලකුණු ලබා දේ. | 65 | **65** |
| 02. **කුසලතාවය** | | **30** |
| **2.1** **අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br>**02.1.1** පශ්චාත් උපාධිය | 05 | |
| **2.2** **වාස්තු විද්‍යාඥයෙකු වශයෙන් වාස්තු විද්‍යා අධ්‍යාපනය හා වෘත්තීය නඟා සිටුවීම පිළිබඳව දක්වන ලද දායකත්වය**<br><br>**02.2.1** ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රකාශන<br><br>• පර්යේෂණාත්මක ප්‍රකාශන (Published papers in journals or conferences)<br>- එක් ප්‍රකාශනයකට ලකුණු 03 බැගින්(උපරිම ප්‍රකාශන 2 යි)<br>• පුවත්පත් / සඟරා ලිපි<br>- එක් ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් (උපරිම ප්‍රකාශන 3 යි)<br><br>**1.1.2** වාස්තු විද්‍යාවට අදාළ දේශීය/ විදේශීය පිළිගත් ආයතනයක දරන ලද තනතුරු සඳහා දරන ලද එක් තනතුරක් සඳහා ලකුණු 02 බැගින් (ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු වන අතර උපරිම තනතුරු 03ක් සඳහා ලකුණු ලබා දේ)<br><br>**02.2.3** ප්‍රශංසා සඳහා<br><br>ආයතන ප්‍රධානියා විසින් පොදු 230 බී ආකෘති පත්‍රය මගින් ලබා දී ඇති එක් ප්‍රශංසා ලිපියකට ලකුණු 01 බැගින් (උපරිම ප්‍රශංසා ලිපි 03ක් සඳහා) | 06<br><br>06<br><br>03 | |
| **02.3** තෝරාපත් කරන තනතුරෙහි කාර්ය භාරය සඳහා දායකත්වය දක්වන ආකාරය සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිදු කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම (Power Point Presentation)<br><br>i. අදාළත්වය (Relevancy) - ලකුණු 02<br>ii. නිර්මාණශීලීත්වය / (Creativity ) - ලකුණු 02<br>iii. ඒ සඳහා හඳුන්වාදෙන නව්‍යතා හා නව යෝජනා (Innovations & Suggestions) - ලකුණු 02<br>iv. කාල කළමනාකරණය (Time Management) - ලකුණු 02<br>v. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (Proficiency in English) - ලකුණු 02<br><br>*සටහන -*<br>(*අ*) ඉහත (v) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ඉංග්‍රීසි භාෂාව මගින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් පමණි.<br>(*ආ*) ඉදිරිපත් කිරීමට අදාළ දෘඩ පිටපත (Hard Copy) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක්ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. | 10 | |

| *ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තනතුරට පත් කිරීම - අනුමත ලකුණු පරිපාටිය* | *උපරිම ලකුණු* | *මුළු ලකුණු* |
|---|---|---|
| **03. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>(a) නායකත්වය - ලකුණු 02<br>(b) සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>(c) පෞරුෂත්වය - ලකුණු 01 | | **05** |
| **මුළු ලකුණු** | | **100** |
| *සැ.යු. –*<br>I. 2.1.1 හා 2.2.1 යටතේ ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ප්‍රකාශන සඳහා ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු වේ. | | |

**05.** රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/28 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ) එම ව්‍යවස්ථාවට සිදු කර ඇති හෝ මින් මතු සිදු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව, තෝරා ගනු ලබන නිලධරයා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින ඉහත තනතුර සඳහා අදාළ තනතුරෙහි රාජකාරි භාර ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

**06.** මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලන දැනට සක්‍රිය සේවයේ නියුතු නිලධාරීන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**07.** පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව, ලියාපදිංචි තැපෑලෙන් 2026 අගෝස්තු මස 07 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි "ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07" යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරෙහි " ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලබන අතර අයදුම්පත් අස්ථානගත වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන පැමිණිලි භාර ගනු නොලැබේ.

**08.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

**09.** අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බා ගත කළ හැකි ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය.

2026 ජූලි මස 02 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.